දුර්ලභ

# පුරාණ ලංකාවෙහි පැවති නීති ශාස්ත්‍රය තුළ නිරූපණය වන

## සදාචාර දර්ශනය

පී.ඩී.පී. රුද්‍රිගෝ
ගෞරව ශාස්ත්‍රවේදී (බටහිර දර්ශනය)
ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්ව විද්‍යාලය
ගංගොඩවිල
නුගේගොඩ.

ප්‍රවේශ අංකය 51
වර්ග අංකය

කැලණිය විශ්ව විද්‍යාලයේ දර්ශන ශාස්ත්‍රපති උපාධිය සඳහා ඉදිරිපත් කරන ලද නිබන්ධයකි.

1982

## විෂය ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රකාශය සහ නිබන්ධයේ මාතෘකාව

### පුරාණ ලංකාවෙහි පැවති නීති ශාස්ත්‍රය තුළ නිරූපණය වන සදාචාර දර්ශනය.

1. නූතන සමාජ රටාව ඔස්සේ සලකා බලනවිට දර්ශන ක්ෂේත්‍රය තුළ ඇතුළත් වන විවිධ උප විෂයයන් ගේ සංඛ්‍යාව ක්‍රමයෙන් දියුණු වී යයි. මෙම අනු විෂයයන් සංඛ්‍යාවේ ලා නීතියේ දර්ශනය ද ඇතුළත් වේ. එම නිසා නීති දර්ශනය තුළ දර්ශනයට අයත් විවිධ ශාඛාවන්ගේ හරය යම් යම් ප්‍රමාණවලින් ගම්‍ය යයි පැවසීම තර්කානුකූල ය. අපේ ව්‍යායාමය වනුයේ තෝරාගනු ලබන එක්තරා නීති ශාස්ත්‍ර ශාඛාවක් තුළ පිළිබිඹුවන සදාචාර දර්ශන ක්ෂේත්‍රය විවේචනාත්මක අධ්‍යයනයකට භාජනය කිරීම ය.

2. දර්ශනය වැනි විෂයයන් අරඹයා කැරෙන පර්යේෂණ බටහිරට හෝ පෙරදිගට සීමා කිරීම අනිවාර්යයෙන් සිදුකල යුත්තක් නො වේ. ශත වර්ෂ විස්සක් පමණ කාලය තුළ බුදු දහමින් පරිපෝෂිත වූ මෙරට ඉතිහාසය තුළ විවිධ ශාස්ත්‍රීය පර්යේෂණ සඳහා ප්‍රමාණවත් කරුණු ඇත. මේ අනුව අපේ පර්යේෂණය සඳහා පදනම් කරගෙන ඇත්තේ මෙරට පුරාණ සමයේ පැවති නීති ශාස්ත්‍රය යි. එය ද අනුරාධපුර යුගයට සීමා කරගෙන තිබෙන අතර අවශ්‍ය අවස්ථාවල දී එම යුගයට පසු කාල පරිච්ඡේදයන් ද සැළකිල්ලට භාජනය කර ඇත.

3. අනුරාධපුර යුගයේ පැවති නීති ශාස්ත්‍රය තුළ නිලීනව පැවති සදාචාර දර්ශනය පිළිබඳ විචාරපූර්වක විමසීමක් කිරීම අපේ අභිප්‍රායයි. එමගින් අගනා කරුණු මතුකොට දැක්විය හැකි ය. මේ නිසා මෙහි මුල් පරිච්ඡේද බෙහෙවින් ඉවහල් කරගෙන ඇත්තේ ඓතිහාසික නෛතික කරුණු එක්රැස් කිරීම සඳහා ය. අවසාන පරිච්ඡේද දෙක මගින් මෙසේ රැස්කර ගත්තාවූ කරුණු සදාචාරමය දෘෂ්ටිකෝණයකින් විශ්ලේෂණය කිරීමටත්, විවේචනය කිරීමටත්, උත්සාහගෙන ඇත්තෙමු. නමුත් එයින් මුල් පරිච්ඡේදවල දී දාර්ශනික සබඳතාව කෙරෙහි අවධානය යොමු නො කළාය යන්න මින් ගම්‍යවන්නේ නැත.